උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2023

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගයේ ආදර්ශ ප්‍රශ්න පත්‍රය 2024

# II පත්‍රය

කාලය : පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය :-.........................................

## විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/E/MF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

( 2 වැනි පිටුව බලන්න. )

01. පහත දැක්වෙන ඡේදය කියවන්න.

මල්බින්දුගේ ගෙදර උදේ පාන්දරින් ම අවදි වන පොඩි මැණිකා, සුරංගියා සහ උක්කු මැණිකා අවදි කරවයි. බිම ඇතිරූ පැදුරු අකුළා දොර මුල්ලේ ගසා කොට්ටා ද පසෙක තබන ඔවුහු පාසල් යෑමට සූදානම් වෙති. කිරිනේලිස් හැඳ සිටින සරමට අමතර ව හිසේ සිට සරමක් පොරවා ගෙන කිරි දොවයි. මල්බින්දු හරකුන්ගේ සාත්තුව අරඹයි. මෙතෙක් කල් නිසි ලෙස දත් මැද මුහුණ නොසේදූ සුරංගියා සහ උක්කු මැණිකා ළිපේ දර අඟුරු කැබැල්ලක් පොල් කටුවක දමා කොටා කුඩු කර දත් මදිති. ඇතැම් විටක අඟුරු කොටනු ලබනුයේ ලුණු ස්වල්පයක් මිශ්‍ර කොට ය. අඟුරුත් ලුණුත් කටේ විෂබීජ ද මඩිමින් දත් සුදු කරයි. බෝම්බු හෝ කරඳ හෝ කෝටුවක් තලා බුරුසුවක් සේ ගෙන දත් මැදීම සිදු කෙරෙයි.

පහත ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් නිවැරදි පිළිතුරු තෝරා ලියන්න.

(1) සුරංගියා සහ උක්කු මැණිකා අවදි කරවන්නේ කවු ද?..............................................................

(2) අඟුරුත් ලුණුත් මිශ්‍ර කර දත් මැදීමෙන් ලැබෙන වාසි මොනවා ද?

.............................................................................................................................

(3) සුරංගියා සහ උක්කු මැණිකා දත් මැදීමට බුරුසුව සකසා ගත්තේ කෙසේ ද?

.............................................................................................................................

(4) කිරිනේලිස් කිරි දෙවීම සඳහා සූදානම් වන්නේ කෙසේ ද?

.............................................................................................................................

(5) කෙටි ඉස්පිල්ල හා දික් පාපිල්ල පමණක් යෙදුණු වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න.

.............................................................................................................................

(6) 'මර්දනය කරමින්' යන අදහස දෙන පදය ඡේදයෙන් තෝරා ලියන්න.

.............................................................................................................................

02. ප්‍රාණවාචී බහුවචන උක්ත පදය වරහන් තුළින් තෝරා ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

( මම, මිනිසුන්, ගුරුතුමා , අපි , ඔහු ) ........................................................

03. පහත දී ඇති වාක්‍යවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. මිනිසුන් පාරේ වැඩ කරති. ( ........... )
2. ගුරුතුමිය සිසුන්ට අවවාද දුන්නා ය. ( ........... )
3. ගංගා සෙමෙන් පහළට ගලා බැස්සෝ ය. ( ........... )

04. පහත සඳහන් වගන්තිය ලිඛිත බසට හරවා නැවත ලියන්න.

(i) රෑ අහසේ තරු බබළනවා.

.............................................................................................................................

(ii) මම කඩයට ගිහින් පෑනක් මිල දී ගත්තා.

.............................................................................................................................

05. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

| ඇෘ / සුපුරුදු / පාසල / සෑම / රාජකාරියේ ය /ම /දවසක / පැවැත්වෙන |
|---|

.................................................................................................................................

06. '' **එක හුස්මට** '' යන ඉඟි වැකියේ අදහස ලියන්න.

.................................................................................................................................

07. පහත වාක්‍යවල සුදුසු විරාම ලකුණු යොදන්න.

(1) මැදගිල්ල තමා ලොක්කා නංගී උත්තර දුන්නා ය

(2) අනතුරක් එහෙමනම් අපිත් යමු කබ්බු පැවසුවේ ය

08. ''**කීකරු යි**'' යන වචනයට විරුද්ධාර්ථ පදය ලියන්න. ..........................................................

09. නිවැරදි අක්ෂරය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

(1) සමර්........... (ථ/ත) (2) පැ.........පත (ල/ළ) (3) අ........මුවට (හි/බි)

10. පහත සඳහන් වචනයේ ඇති ස්වර ශබ්ද තිත් ඉරි මත ලියන්න.


සෛල - .................................................................................................................

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(1) Spider :- ............................................ (2) Beach :- ..............................................

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචන **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.





(1) ............................................. (2) ..............................................

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) classroom / to / Let’s / the / go.........................................................................

(ii) you? / grade / which / In / are...........................................................................

14. 'වේණ්ඩුම්' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න. ...........................


15. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

එහෙ බලන්න. ..............................................................................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

16. පහත සඳහන් සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

90 070 :-..........................................................................................................................

17. 


මෙම ගණක රාමුවේ සියස්ථානයේ ඇති ගණක දෙකක් ඉවතට ගෙන ඒවා සියල්ල දහසස්ථානයට දැමූ වේ නම් නිරූපණයවන සංඛ්‍යාව ලියන්න..........................................................................

18. පහත සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට සකසන්න.

9906 , 66069 , 6609 , 9996 :-..........................................................................

19. පාසලක සිටින සිසුන් 2000කින් 937ක් වාර්ෂික චාරිකාව සඳහා සහභාගි වූයේ නම් චාරිකාවට සහභාගි නොවූ සිසුන් ගණන කීය ද?..........................................................................

20. පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.


.............., 8, 15, 22, 29, 36, ..............

21. කර්මාන්ත ශාලාවක දින තුනක් තුළ නිපදවන ලද සබන් කැට ගණන් පිළිවෙළින් 2208, 1654 හා 3020ක් වේ. දින තුනේ දී නිපදවා ඇති මුළු සබන් කැට ගණන කීය ද?................................

22. පෙ.ව. 5.20ට පිටත් වූ බසයක් පැය 3 මිනිත්තු 45කට පසු ගමනාන්තයට ළඟා විය. බසය ගමනාන්තයට ළඟා වූ වේලාව පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න......................................

23. 50kg සහල් ගෝනියකින් 25kg 375g ක් විකුණන ලදි. ගෝනියේ ඉතුරු වූ සහල්වල බර කොපමණ ද? .................. kg ..................... g

24. පහත රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.



..................................................


25. පාසලක 5 ශ්‍රේණියේ ළමයින් සඳහා එක් අයෙකුට පෑන් හතර බැගින් බෙදා දීමට පෑන් 820ක් අවශ්‍ය ය. 5 ශ්‍රේණියේ සිටින ළමයින් ගණන කීය ද?..........................................................................

26. සංඛ්‍යාවක් හයෙන් බෙදූ විට පිළිතුර 132 වේ. එම සංඛ්‍යාව කුමක් ද? .......................................

27. ප්‍රධාන පාරේ සිට නිවසට 32m දුරක් තිබුණි.පාරේ සිට නිවසට ජලය ලබා ගැනීම සඳහා 13m 95cmක් සහ 9m 5cmක් දිග නළ දෙකක් සම්බන්ධ කර ඇත. පාරේ සිට නිවසට ජලය ලබා ගැනීමට තව කොපමණ දිගකින් යුත් නළයක් අවශ්‍ය වේ ද?..................................................

28. අඹ ගෙඩියක් රුපියල් 16ක් වේ. අඹ ගෙඩි දහයක් සඳහා වැය වූ මුදල නවීන් හා ඔහුගේ යහළුවන් සිව්දෙනා අතරේ සමව බෙදාගනු ලැබුවේ නම් එක් යහළුවෙකු වැය කළ මුදල කොපමණ ද? රුපියල් ..................................................

29. ළමුන් 35 ක් සිටින පන්තියක එක්තරා සතියක සිසුන්ගේ **පැමිණීම** පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.




(1) සිකුරාදා නොපැමිණි සිසුන් ගණන 10ක් නම් එදින **පැමිණි** සිසුන් ගණන ප්‍රස්තාරයේ නිරූපණය කරන්න.

(2) වැඩි ම සිසුන් පිරිසක් **නොපැමිණි** දවස කවදා ද? ..................................................

(3) සමාන සිසුන් ප්‍රමාණයක් පැමිණි දවස් කවදා ද? ..................................................

(4) සඳුදා **නොපැමිණි** සිසුන් ගණන කීය ද? ..................................................

- **30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතරින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

30. සැම විට ම අප තුළ ඇති කර ගත යුතු යහපත් චර්යාවකි.

(1) යටහත් චර්යා (2) සහනශීලී චර්යා (3) ආක්‍රමණශීලී චර්යා

31. යහපත් දේ සිදු කිරීමෙන් හා නීති රීති සුරැකීමෙන් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,

(1) ප්‍රසංසා හිමි වීම. (2) සැම විට ම පරාජය වීම. (3) සමච්චලයට ලක්වීම.

32. සර්පයකු දෂ්ට කළ විට කළ යුතු හොඳම දෙයකි.

(1) සපා කෑ ස්ථානය ඉහළින් තදින් වෙලුමක් යෙදීම.

(2) ඖෂධීය පාන වර්ගයක් බීමට දීම.

(3) සපා කෑ ස්ථානය සබන් යොදා සේදීම.

33. වලාකුළින් බැස - සමන්කුළක් වැද.... හා එම්බා ගංගා නවතිනු..... ගීත රචනා කර ඇත්තේ,


(1) කරුණාරත්න අබේසේකර (2) මහගම සේකර (3) අරිසෙන් අහුබුදු

34. බෝවන රෝගයක් වැළඳී ඇති බව දැන ගත් පසු තමා අනුගමනය කළ යුතු යහපුරුද්දකි.

(1) සෙනග ගැවසෙන පොදු ස්ථානවල රැඳී සිටීම.

(2) හැකි තරමින් අන් අයගෙන් ඈත්ව සිටීම.

(3) සාමාන්‍ය පරිදි එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම.

35. 

රූපයේ දක්වා ඇති ශාක පත්‍ර දෙක වන්නෙ,

(1) එඬරු, සියඹලා

(2) ගස්ලබු, කරපිංචා

(3) කරවිල, නිදිකුම්බා

36. සමාජ විරෝධී ක්‍රියාවක් වන්නේ,

(1) ළමා මෙහෙකාර සේවය. (2) පොදු ස්ථාන පිරිසිදුව තබා ගැනීමට සහය වීම.

(3) දරුවන් දෙමාපියන්ගේ කටයුතුවලට නිවසේ දී සහය වීම.

37. විදුලි ඇඹරුම් යන්ත්‍රය සිදුකරන කාර්ය සඳහා අතීතයේ දී භාවිත කර නොමැති උපකරණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වංගෙඩිය හා මෝල් ගස (2) සෙක්කුව හා කිනිහිරය (3) කුරහන්ගල හා මිරිස්ගල

38. තෛපොංගල් උත්සවය සමරන හින්දු බැතිමතුන් ගෞරවයක් දක්වන සත්වයා වන්නේ,

(1) නාගයා (2) මොනරා (3) ගවයා

39. සර්ව භක්ෂක සතුන් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) පිළිහුඩුවා, කුකුළා, මොනරා (2) කොකා, ඌරා, බත්කූරා (3) කුකුළා, කපුටා, ඌරා

40. ශ්‍රී ලංකාවට ආවේණික ශාකයක් නොවේ.

(1) ගිරිතිල්ල (2) රබර් (3) හොර

41. ශාක පත්‍රයක පත්‍ර දාරයේ පමණක් කටු සහිත ශාක පත්‍ර යුගලය තෝරන්න.

(1) අන්නාසි, පතොක් (2) කෝමාරිකා, අන්නාසි (3) නිදිකුම්බා, එලබටු

42. සතුන්ගේ ගමන් විලාසය පිළිබිඹු නොවන වන්නම වන්නේ,

(1) හනුමා වන්නම (2) මුසලඩි වන්නම (3) වෛරොඩි වන්නම

43. රාත්‍රී කාලයේ පිපෙන මල් බොහෝ විට,

(1) ඉතා සුවඳවත්වන අතර විවධ වර්ණයෙන් යුක්ත ය.

(2) ඉතා සුවඳවත්වන අතර සුදු වර්ණයෙන් යුක්ත ය.

(3) සතුන් ගොදුරු කර ගැනීමට හැඩ ගැසී ඇත.

44. ජාත්‍යන්තර මට්ටමේ රැස්වීම් හෝ ක්‍රීඩා තරගවල දී අපේ රට ද නියෝජනයවන බව අප බොහෝවිට හඳුනා ගනු ලබන්නේ,


(1) රාජ්‍ය ලාංඡනය මගින් (2) ජාතික කොඩිය මගින් (3) ජාතික ඇඳුම මගින්

45. ජාතික කොඩිය හා රාජ්‍ය ලාංඡනය යන දෙකෙහි ම දැකිය හැකි සංකේතය කුමක් ද?

(1) ඉර හා හඳ (2) කඩුව අතින් ගත් සිංහයා (3) පුන්කලස

46. සන්නිවේදන ක්‍රම අතරින් ඉතා වේගවත් සන්නිවේදන ක්‍රමයක් වන්නේ,

(1) පුවත්පත (2) පෝස්ටර් (3) අන්තර්ජාලය

47. 


සුළං දිශා දර්ශකය නිරීක්ෂණය කර සුළඟ හමා යන දිශාව තෝරන්න.

(1) නැගෙනහිර සිට බටහිර දිශාවට

(2) බටහිර සිට නැගෙන හිර දිශාවට

(3) නැගෙනහිර සිට උතුරු දිශාවට

48. රසායනික ද්‍රව්‍යක් ලෙස ක්ලෝරීන් යොදන්නේ,

(1) ජලය පිරිසිදු කිරීමට (2) ආහාර පිරිසිදු කිරීමට (3) ඇඳුම් පිරිසිදු කිරීමට

49. ක්ෂණික ආහාර අනුභව කිරීමෙන් සෞඛ්‍යයට ඇතිවිය හැකි අහිතකර බලපෑමක් වන්නේ,

(1) ශරීරයේ බර වැඩිවීම. (ස්ථූලභාවය)

(2) ශරීරය වර්ධනය වීම.


(3) ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම.

50. අපිරිසිදු ජලය භාවිත කිරීමෙන් පමණක් වැළදෙන රෝග කාණ්ඩය තෝරන්න.

(1) කහඋණ, කොළරාව, උණ සන්නිපාතය

(2) බරවා, මහාමාරිය , පාචනය

(3) කහඋණ, මැලේරියා උණ, සෙංගමාලය

51. 

වඩු කර්මාන්තයේ දී '' වරක්කලය '' නම් මෙම උපකරණය භාවිත කරන්නේ,

(1) ලීයක සිදුරක් විද ගැනීමට

(2) ලීයක් සුමට කර ගැනීමට

(3) ලීයක සමාන්තර රේඛාවක් ඇඳ ගැනීමට

52. විටමින් D ඌණතාවය නිසා වැළදෙන රෝග ලක්ෂණයක් වන්නේ,

(1) හිසේ කැක්කුම , වමනය

(2) කට කොන් වණ වීම , සම ඉරි තැලීම.

(3) ඇස් පෙනීම දුර්වල වීම, අස්ථි වේදනාව

53. සිසුන් රවුමක සිට රවුමේ මැද සිටින සිසුන් තනි කකුලෙන් ඇල්ලීමේ ක්‍රීඩාව හඳුන්වන්නේ,

(1) කටුව හැංගීම (2) කුන්දුවෙන් අල්ලමු (3) බට්ටා පැනීම

54. ඖෂධයක් ලබා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු අතර ඉතා වැදගත් නොවන්නේ,

(1) ඖෂධ ලබාගත යුතු වාර ගණන

(2) ඖෂධයේ වෙළඳ නාමය

(3) ලබාගත යුතු මාත්‍රාව

55. පහත් බිම් ගොඩ කිරීම නිසා සිදුවන ස්වාභාවික අනතුරකි.

(1) නාය යාම (2) ගංවතුර ගැලීම. (3) සුනාමි ඇතිවීම

56. පස සෝදා යාම 'පාංශු ඛාදනය' ලෙස හැඳින්වේ. පාංශු ඛාදනයට බලපාන හේතුවක් වන්නේ,

(1) තණකොළ ඉවත් කිරීම. (2) ගල් වැටි යෙදීම. (3) ගස් සිටුවීම.

57. "මේ කලා වැවේ නිල් දියකඳ මගේ වටිනා ම වස්තුවයි" මෙම ප්‍රකාශය කළේ,

(1) ධාතුසේන රජතුමා (2) මහසෙන් රජතුමා (3) මහා පරාක්‍රමබාහු රජතුමා

58. 3R සංකල්පයට අයත් කරුණක් නොවන්නේ,

(1) නැවත නැවත භාවිතය. (2) ප්‍රතිචක්‍රීකරණය. (3) ජීවානුහරණය.

59. අස්වැන්න නාස්ති වීම වළක්වා ගැනීමට කළ හැකි කාර්යක් නොවේ,

(1) නියමිත කාලයට පෙර අස්වැන්න නෙළාගත යුතු ය.

(2) නෙළාගත් අස්වැන්න ආරක්ෂිතව ගබඩා කළ යුතු ය.

(3) සමහර බෝගවලට ආවරණ යෙදිය යුතු ය.

60. දිනක් ඔබ පාසල ඇරී නිවසට යන විට නිවසේ දොර වසා තිබුණි. වට පිටාව පරීක්ෂා කළ ද කිසිවෙකු පෙනෙන්නට නොවී ය. එහෙත් නිවසේ දොර විවෘත කරන එක් යතුරක් ඔබ සතුව ඇති බව ඔබට සිහි විය. මෙතැන් සිට ඔබ කටයුතු කරන ආකාරය ගැන වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..........................................................................................................

..........................................................................................................

2. ..........................................................................................................

..........................................................................................................

3. ..........................................................................................................

..........................................................................................................

* * *

( නිවැරදි අත් අකුරු හා පිරිසිදු බවට ලකුණු දෙකක් හිමි වේ. )